මගේ අංකය : SG/Admin/CS/5/17 - Annual Transfer (Internal) - 2022,
ආයතන අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ - 05.

2022.11. 17 වෙනි දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්/අධ්‍යක්ෂ(මැ.සි.ආ.)/අධ්‍යක්ෂ (මුදල්)/ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්/මිනින්දෝරු අධිකාරිවරුන්,
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී,
කාර්මික හා පරිපාලන නිලධාරිවරුන්/පරිපාලන නිලධාරී,
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්,

**<u>ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2022 ( දෙපාර්තමේන්තුව තුළ)</u>**

ඒකාබද්ධ සේවාවන්හි සියලුම අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් 2022 පෙබරවාරි මස පළමු වැනි දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් සේවාවන් වල නිලධාරීන්ගෙන් **<u>2021 නොවැම්බර් මස 30 වන දින දක්වා</u>** අයදුම්පත් භාර ගනු ලැබේ.

I. රජයේ භාෂා පරිවර්තක සේවය ( I පන්තිය )
II. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ( 2, 3 පන්ති )
III. සංවර්ධන නිලධාරී සේවය ( III / II / I ශ්‍රේණි )
IV. කළමනාකරණ සේවා නිලධාරී සේවය ( III / II / I ශ්‍රේණි )
V. ඒකාබද්ධ රියදුරු සේවය ( III / II / I, විශේෂ ශ්‍රේණි )
VI. කාර්යාල සේවක සේවය ( III / II / I, විශේෂ ශ්‍රේණි )

02. දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ HuRIMS දත්ත පද්ධතියට පිවිස 2022 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් කල හැක. **<u>ඊට යොමු වීම සඳහා වූ උපදෙස් පත්‍රිකාව මේ සමඟ ඇමුණුම 01 මගින් දක්වා ඇත.</u>**

02.1 **2021.11.30** දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව දන්වමි.

03. අභ්‍යන්තර ස්ථාන මාරු වීම් සඳහා ඉල්ලුම් කරන නිලධාරීන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ දී පහත ප්‍රතිපත්ති පොදුවේ උපයෝගී කර ගනු ලැබේ.

03.1 2021 දෙසැම්බර් 31 දින වන විට,

(අ) තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(ආ) එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම්වලට යටත් වන්නේය.

(ඇ) මීට අමතරව දෙපාර්තමේන්තුවෙහි පරිපාලන අවශ්‍යතාවය මත නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සඳහා යටත් වේ

03.2 සේවා ස්ථානයක අවුරුදු 02 කට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරුවීමක් ඉල්ලන්නේ නම්, ඔහුට / ඇයට සේවා අවශ්‍යතාවන්ට අනුකූලව එවැනි ස්ථාන මාරුවීමක් ලබා දිය හැකිය.

(අ) ස්ථාන මාරුවීමක් ලැබීමට සුදුසුකම් ලබන නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් දීමට සිදුවන අවස්ථාවක දී එම ස්ථානයේ වැඩිම සේවා කාලය ඇති නිලධාරියාගේ සිට අවරෝහණ පිළිවෙලින් 04:1 (ආ) ඡේදයේ අවශ්‍යතා සම්පූර්ණ නිලධාරීන් පමණක් එම ස්ථානයෙන් පිටතට ඇයගේ / ඔහුගේ ඉල්ලීමක් රහිතව ද මාරු කළ හැකිය.

(ආ) යම් සේවා ස්ථානයක් වෙත ඉල්ලීම් නොමැති නම් නියමිත කාලයට වඩා වුව ද එම ස්ථානයේ සේවය කරන නිලධාරියාට තමා කැමැත්තේ නම් එක දිගටම සිටීමට ඉඩ දිය හැකිය.

(ඇ) නිලධාරියාට මෙන්ම පවුලේ අයට ද ඇතිවන අපහසුතාවන් අවම කිරිමට හැකි වන සේ ස්ථාන මාරු වීමක් ලබා දීමට පහසු වන පරිදි සෑම නිලධාරියෙකු විසින්ම තමා ඉල්ලා සිටින සේවා ස්ථානයකට අමතරව තවත් විකල්ප ස්ථාන දෙකක් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කල යුතුය.

(ඈ) අනිවාර්යය ස්ථාන මාරු නියෝග කිරීමේ දී නිලධාරියා පිළිබඳව පහත කරුණු සලකා බලනු ලැබේ.

I. විවාහක / අවිවාහක බව
II. දූ දරුවන්ගේ වයස් හා අධ්‍යාපන කටයුතු
III. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය
IV. ස්ථිර පදිංචි ගම් ප්‍රදේශය

(ඉ) නිලධාරියාගේ ඉල්ලීම මත හෝ වෙනත් විශේෂිත කරුණු මත මිස අවුරුදු 53 ඉක්ම වූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකරන අතර දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

(ඊ) එසේම අවුරුදු 53 ඉක්මවා ඇති අවුරුදු 55න් විශ්‍රාම යාම සඳහා විධිමත් පරිදි ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නොවන අතර එසේ විශ්‍රාම යාම් පිළිබඳව තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් නොකරන නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත් වේ.

(උ) **පරිවාස කාලය අවසන් නොකළ නවක නිලධාරීන් මෙම ස්ථාන මාරුවීම් වලට ඉඩ දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවන්ට අනුකූලවය.**

04. අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන සියලුම නිලධාරීන් තමන්ගේ අයදුම්පත අදාළ අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

05. මෙම චක්‍රලේඛයේ ඇතුළත් කරුණු ඔබ යටතේ සේවය කරන අදාළ සියලුම නිලධාරීන්ගේ දැන ගැනීමට සලස්වා ඔබ වෙත ලැබෙන අයදුම්පත් නියමිත දිනට ප්‍රථම එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

**<u>සටහන</u>** :

01. අභ්‍යන්තර ස්ථාන මාරු අපේක්ෂා නොකරන, සේවා කාලය වසර 05 ට වැඩි සියලුම පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල වල ඒකාබද්ධ සේවයට අයත් සියලුම නිලධාරීන් ස්ථාන මාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03 ක් සඳහන් කර එවීමට කටයුතු කරන්න. එම තොරතුරු පළාත් සර්වේයර් ජනරාල් මගින් ඔහුගේ නිර්දේශය සහිතව මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ද කාරුණිකව දන්වමි.

ඒ.දිසානායක,
සර්වේයර් ජනරාල්.

ඒ. දිසානායක
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ - 05.

ඇමුණුම 01

**උපදෙස් පත්‍රිකාව**

2022 ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.survey.gov.lk)"Staff Accessහි " HuRIMS භාවිතා කර පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

පියවර 1: HuRIMS දත්ත පද්ධතියට ඇතුළු වීම සඳහා
User Name: දෙපාර්තමේන්තුවේ සේවක අංකය
Password: ජාතික හැඳුනුම්පත් අංකය

පියවර 2 : දකුණු පස ඉහල කෙලවරේ දක්වා ඇති "Apply Transfer For 2022" තෝරා දත්ත ඇතුලත් කිරීමේ පහසුකම ලබා ගන්න.

පියවර 3 : ඔබගේ තනතුර තෝරා අදාල විස්තර ඇතුලත් කිරීමට කටයුතු කරන්න.
මෙහිදී ස්ථාන මාරු අයදුම් පත්‍රයට අදාල HuRIMS දත්ත පද්ධතියේ තිබෙන තොරතුරු ඔබට පෙන්නුම් කෙරේ. (*) ලකුණින් දක්වා ඇති තොරතුරු නිවැරදි නොවේ නම් ඔබට නිවැරදි තොරතුරු ඇතුලත් කිරීම හෝ අළුතින් තොරතුරු ඇතුලත් කල යුතු නම් ඔබට එම තොරතුරු ඇතුලත් කල හැක .ඊලඟ පිටුව සඳහා "Next" Button එක තෝරන්න.

පියවර 4 : පසුගිය වර්ෂ වල දෙපාර්තමේන්තුව තුළ සේවය කල ස්ථාන පිළිබඳ විස්තර ඔබ විසින් දත්ත පද්ධතියට ඇතුලත් කර ඊළඟ පිටුව සඳහා "Next "Button එක තෝරන්න.

පියවර 5 : (i) ස්ථාන මාරු වී යාමට කැමති සේවා ස්ථාන 03ක් පිළිවෙලින් තෝරන්න .
(ii) පහත සඳහන් තොරතුරු ඔබ විසින් දත්ත පද්ධතියට ඇතුලත් කල යුතුය.

- වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කල දිනය
- වර්තමාන ලිපිනය
- ස්ථාන මාරු ඉල්ලීමට හේතුව
- කලත්‍රයාගේ රැකියාව හා සේවය කරන දිස්ත්‍රික්කය

(iii) ඔබගේ තොරතුරු දත්ත පද්ධතියට යොමු කිරීමට "Submit" Button එක තෝරා ඒ බව තහවුරු කල යුතුය.
(iv) ඔබ විසින් ෆෝරමයට ඇතුලත් කර ඇති දත්ත තිරයේ දිස්වන අතර එය ඔබට පරීක්ෂා කර තොරතුරු නිවැරදි නම් "Finish Button" එක තෝරන්න. එසේ නොවන්නේ නම් "Back Button" එක තෝරා අවශ්‍ය තොරතුරු නිවැරදි කරන්න.
(v) "Finish Button" එක තේරීමෙන් පසු ඔබගේ සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු ඉල්ලුම් පත්‍රය තිරයේ දිස්වන අතර මුද්‍රණය කරගැනීමට අදාල Web Browser හි පවතින මුද්‍රණ ලකුණ (Print Option) භාවිතා කල හැකිය.
(vi) මුද්‍රණය කරන ලද අයදුම්පත්‍රය අදාල අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ මත සර්වේයර් ජනරාල් කාර්යාලයට එවීමට කටයුතු කරන්න.